2020.02.28 . අරුණ

පිටුව 7

ශේෂ පත්‍රය
BALANCE SHEET

# උද්ධමනය පාලනය කරන පියවර

කලින් ගත් මිලට එම භාණ්ඩ හා සේවා මිල දී ගත නොහැකිවන අවස්ථා තිබේ. එයට හේතුව උද්ධමනයේ බලපෑමය. 2020 ජනවාරි මාසයේ උද්ධමනය ඉහළ නැග ඇති බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව දක්වයි. එය ජනතාවට පීඩනයක් ඇති කරන බව සඳහන් කළ යුතුය.

වාර්තා දක්වන අන්දමට කලින් වසරේ සමාන කාලසීමාව හා සසඳන විට උද්ධමන අනුපාතිකය සියයට 7.6 කි. 2019 දෙසැම්බර් මාසයේ මෙම අනුපාතිකය සියයට 6.2 ක සීමාවේ තිබුණි. මෙම වර්ධනය ජන ජීවිතයට දැනෙන තත්ත්වයකි. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා සේවා වල මිල ඉහළ නැගීම ජීවන වියදම ගැන අනතුරු අඟවයි. සහල්, පොල් සහ එළවළු වර්ගවල මිල ඉහළ ගියේය. එය සැපයුම අඩුවීමේ ප්‍රශ්නයකි. දැන් එළවළු මිල තරමක් අඩු වෙමින් තිබේ. එහෙත් එය නිශ්චිත නැත. ලැබෙන ආදායම අනුව පැවැත්ම හද ගන්නට සිදුව තිබේ. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිල ඉහළ යන විට එයට ගැළපෙන පරිදි එදිනෙද කටයුතු සකස් කරගත යුතුව ඇත.

උද්ධමනය ඉහළ යන හේතු ගණනාවක් තිබේ. සැපයුම අඩුවීම එකකි. මූල්‍ය වෙළඳ පොළ හැසිරීම ද සියුම් ලෙස බලපායි. රජයේ ණය ගැනීම ඉහළ යන විට එහි අනිවාර්ය ප්‍රතිඵලය උද්ධමනය නැගීමය. භාණ්ඩ හා සේවා මිල ඉහළයාම පාලනය කළ හැකි තරමට පවත්වාගෙන යෑම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වගකීමකි. එය මගහැරෙන විට ආදයම ප්‍රමාණවත් නැති බව කියන වැඩ කරන ජනතාව වැඩි වැටුප් ඉල්ලා පාරට බසිනු ඇති අතර නැවත වටයකින් පඩි වැඩිකරන්නට ආණ්ඩුවට සිදුවන්නේය. එහි පඩි ගෙවන්නට ධනය නැතිවිට තවත් වටයකින් බදු නැංවීම හෝ ණය ගැනීම කරන විට මෙය විශම චක්‍රයක් බව අවබෝධ කරගත යුතුය. ආර්ථිකය මනා සේ පාලනය කිරීම හා නිෂ්පාදනය නැංවීම එකම විසඳුමකි.

අනෙක් පැත්තක් ද තිබේ. ආණ්ඩුව සෑහෙන බදු ප්‍රමාණයක් අඩු කර

අනෙක් පැත්තක් ද තිබේ. ආණ්ඩුව සෑහෙන බදු ප්‍රමාණයක් අඩු කර තිබේ. වැට් බදු සියයට පනහකින් කපා හැරීම සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කර ඇත. සමාගම් වලට එය බලපාන අන්දම පුළුල්ය. මෙතෙක් ආනයනයේ දී අය කරන ලද බදු වෙනස් කර තිබේ. කෘෂි, ධීවර හා සත්ත්ව පාලන අංශ වලට සෑහෙන බදු සහන ලැබී ඇත. තොරතුරු තාක්ෂණ අංශවලට ද හිමි වී තිබේ. විශේෂයෙන් උපයන විට බදු ගෙවන ලද පිරිසට ද වාසියක් අත්පත් වී ඇත. එය වෙනම එකකි. මෙම බදු අඩුවන විට එය වෙළඳපොළට දැනෙන එකක් විය යුතුය. බදු අඩු කිරීමෙන් ආණ්ඩුවට අහිමිවන ආදයම රු. බිලියන 560 ක් බව කියැවේ. එය සැලකියයුතු මුදලකි. අත් හරින දේ ජනතාවගේ අතට ලැබිය යුතුය. ආදයම් බදු දෙපාර්තමේන්තුව පවා තමන්ට අහිමිවූ ආදයම නැවත ජනතාවට නොලැබුණ බව ප්‍රකාශ කරන බව පෙනේ. පාරිභෝගික අධිකාරිය මේ ගැන අවධානයෙන් සිටින බව ප්‍රකාශ කර ඇත. වෙළඳපොළ සිදුවන දේ ගැන විමසිලිමත්ව ක්‍රියාකිරීම වැදගත්ය.

උද්ධමනය හැදෙන්නේ මෙම සියලු පැති එකතුවීමෙන් වන අතර වෙළඳපොළ හා නිෂ්පාදන අංශ එක සේ විනිවිද පෙනෙන ක්‍රමයකින් හැසිරවීමට අවශ්‍ය තීරණ ගැනීම අවශ්‍ය කෙරේ. එය එසේ නොවන විට තවත් බර එකතුවන අතර එය මහජනතාවට හිරිහැරයකි.

■ පී. කේ. පී. සරත්